## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : **සහකාරවතු අධිකාරිවරු**

**සුදුසුකම්** : **සහකාරවතු අධිකාරිවරු**

(අ) බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් කෘෂිකර්ම / වතු කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

   සහ

   ප්‍රාදේශීය වතු සමාගමක, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ (SLSPC) හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ (JEDB) අභ්‍යාසලාභී වැවිලිකරුවකු (Creeper) ලෙස මාස 9 ක කාලයක් පුහුණුවක් ලබා තිබීම.

2. තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් / ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් නිකුත් කළ තේ වැවිලි ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

   සමග

   සංස්ථාවක, මණ්ඩලයක, ප්‍රාදේශීය වැවිලි සමාගමක හෝ ප්‍රසිද්ධ ව්‍යවස්ථාපිත ආයතයක, අදාළ ක්ෂේත්‍රයේ, අවම වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

   සහ

   ප්‍රාදේශීය වැවිලි සමාගමක, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ (SLSPC) හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ (JEDB) අභ්‍යාසලාභී වැවිලිකරුවකු (Creeper) ලෙස මාස 9 ක කාලයක පුහුණුවක් ලබා තිබීම.

3. රාජ්‍ය / අර්ධ රාජ්‍ය සංවිධානයක හෝ පිළිගත් ප්‍රාදේශීය වැවිලි සමාගමක සහකාර වතු අධිකාරී තනතුරක අවම වශයෙන් වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අමතර ප්‍රතිලාභ** : අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය යටතේ පහසුකම්.

සේව්‍යයා විසින්, තම වැටුපෙන්, සේවක අර්ථසාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතිය වෙත අවම වශයෙන් 10% දායකත්වයක් ලබාදිය යුතු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින්, ඒ සඳහා, 12% ක දායකත්වයක් සමග අමතර 3% දායකත්වයක් සේවක භාර අරමුදලට ලබා දෙනු ඇත.

අධීක්ෂණ කටයුතු සඳහා මෝටර් සයිකලයක් හෝ දීමනාවක් සහ ඉන්ධන කෝටාවක් ලබා දෙනු ඇත. ගෘහභාණ්ඩ සහිත බංගලාවක් සමග අභ්‍යන්තර හා බාහිර කම්කරු ශ්‍රමය එක් අයකු සඳහා බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

**වැටුප් පරිමාණය** : ඉහත තනතුර සඳහා අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, JM 1-1-2016 රුපියල් [42,600 - 10X755 - 18X 1,135 - 70,580] ලෙසට වූ වැටුපක් හිමිවේ.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**බඳවාගැනීමේ ක්‍රම වේදය** : පත් කිරීමේ බලධාරීන් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරේ.

ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය

| | |
|---|---|
| ● අදාළ අමතර පළපුරුද්ද | - ලකුණු 30 |
| ● අදාළ අමතර සුදුසුකම් | - ලකුණු 30 |
| ● වෙනත් ලද ජයග්‍රහණ | - ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේදී ලබන කාර්ය සාධනය | - ලකුණු 25 |
| | **ලකුණු 100** |

**වෙනත්** : මෙම තනතුරුවලට සිදුකරනු ලබන සියලුම පත්කිරීම් අදාළ බඳවාගැනීමේ ක්‍රමවේදයේ විධිවිධානවලට අනුගතව සිදු කෙරේ.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

තනතුරේ රාජකාරි නියමාකාරයෙන් ඉටුකිරීම සඳහාත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහත්, මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම්පත්** : අයදුම්කරුවන් විසින්, සියලුම විස්තර හා උප්පැන්න, අධ්‍යාපනික සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සහිතව සකස් කළ අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අදාළ භාරගැනීම අවසන් කරනු ලබන වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුය.

**අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය :**

2023 මාර්තු 07 වන දිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක. 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**011-5875895** 

**2023-02-14**